# හද රිදවන මතක සුවඳ



26

**රෝහිත මුණසිංහ**
ප්‍රංශයේ සිට

අරුඩ නම්වලින් හෝ මා මෙහි සඳහන් කර ඇති පුද්ගලයන් බොහෝ දෙනෙකු අන් පුද්ගලයන් හා විරසකය. මෙහි සදහන් කර ඇති කුඩා කුඩා කල්ලි කණ්ඩායම් අන් කල්ලි නොරුස්සනේය.

අභයගුණ හා ඥානපාල මිත්‍රයන් යයි මා සිතා සිටියදී අභයගුණ ඥානපාල ගැන මට කියන ලද්ද එකිනෙකා අතර පවතින බෙලිකපා ගැනීමේ සීතල යුද්ධය ගැන හොඳ උදහරණයකි.

"දේශපාලන වචන ටිකක් දලා මහා මිනිහා වගේ කථා කරාට ඕකා මහ මැට්ටා. අළු ගසා දාලා ඇවිල්ලා තියෙන්නේ ප්‍රංශෙට ආවට පස්සේ. ගෝලයෝ හතරපස් දෙනෙක් තියාගෙන නිකං 'අයියා' වගේ ඉන්න හරි ආසයි. විප්ලවේ දිනුව නම් පැරිසියේ පෙළපාලි යන්නයි හිටියේ. දැන් කොහොමද මේ පාරත් කෙළව ගන්තා කියලා බැණ බැණ ඉන්න හැටි ?"

අභයගුණ ගැන ඥානපාල මට කියන්නේ තවත් කථාවකි.

"ඔහේගේ යාළුව වගේ නෝංජලයෙක් මේ පැරි-සියේම නැතුව ඇති. නෝනා කාමරේ ඉඳගෙන 'අ' කියන කොට මැදසාලේ වාඩිවෙලා හිටපු මිනිහා නැගිටලත් ඉවරයි. 'බේ' කියන කොට කකුල් දෙන ළඟ. අර අහවල් එක තියනවද කියලත් සැකයි. 'මොත්තේ' වැඩ වලට නම් රජා. එහෙන් මෙහෙන් ජල්බරි දාලා ප්‍රංශ ආණ්ඩුවෙන් ගන්න තියෙන දේවල් හතර වටින්ම ගත්තා. මම හිතන්නේ ඔහේටත් 'මොත්තේ දැම්මා'.

මේ පිරිස අතරින් කවුරුන් විසින් කරන ලද්දැයි නොදන්නා නමුදු 87"89 අරගලයට අදළ මහා විහිළුව සිද්ධ වී තිබුණේ ද පැරිසියේ ය. පැරිසියේ ඇති සිංහල වෙළඳ සැලක් වසා දමන්නැයි දේශප්‍රේමී ජනතා ව්‍යාපාරයේ පැරිස් කමිටුව නමින් ලිපියක් යවා තිබිම එම ලෝක විහිළුවයි.

මා ප්‍රංශයට ඒම පක්ෂයේ මැදිහත්මක් නැති පුද්ගලික ගමනක් නිසා පක්ෂයේ වැඩ කරන්නේද? නැද්ද? යන්න මගේ කැමැත්ත මත තීරණය කළයුතු දෙයක් විය. පක්ෂය සම්බන්ධයෙන් විරෝධයක්, චෝදනාවක්, අවලාදයක් යන කිසිත් මාවෙත නොවීය . එහෙත් මට විවේචනයක් තිබිණ. එය සහෝදරාත්මක මිතුරු විවේචනයක් මිස ප්‍රහාරාත්මක සතුරු විවේචනයක් නොවීය. එසේම යෝජනා ද තිබිණි. මෙම විවේචන හා යෝජනා පක්ෂයට ඉදිරිපත් කොට පක්ෂයෙන් පිළිතුරු ලබාගෙන මිස කිසිදු විමර්ශන බුද්ධියකින් තොරව වැඩ කිරීමේ තේරුමක් නැතැයි මා තීරණය කර තිබුණි.

පක්ෂයට ඉදිරිපත් කළයුතු එම ලියවිල්ල මා කෙටුම්පත් කරන ලද්දේ යුගොස්ලාවියාවේ සහ ඉතාලියේ නිකරුනේ ගතකළ කාලයේදී ය. පැරිසියට පැමිණ මාස හයක් පමණ ගතවනතුරු මට එම ලිපිය සකස් කිරීමට නොලැබුනේ නවාතැන් හා වෙනත් ප්‍රශ්න කිහිපයක් සම්බන්ධයෙන් මුහුණ පාන්නට සිදු වූ අම්හිරි වාතාවරණය නිසාවෙනි.

පක්ෂය සම්බන්ධයෙන් මේ ප්‍රශ්න නොතිබුණෝ වුවද පැරිසියට පැමිණි විගස පක්ෂයේ වැඩකළ නොහැකි වෙනත් ප්‍රශ්නයක් ද මට තිබිණ. එය මගේ බිරිඳගේ ආරක්ෂාව සම්බන්ධයෙන් වූ බරපතල ගැටලුවයි. මගේ බිරිඳ වූ ඇය පක්ෂයේ සහෝදරියකි. පක්ෂයේ අධ්‍යාපන කඳවුරකට ද සහභාගී වූ සාමාජිකාවක වූ ඇය ප්‍රමාණවත් දේශපාලන දැනුමක් සහිතව ආසනයේ කාන්තා අංශය භාරව කටයුතු කළාය. මැයි පෙළපාලියේ කාන්තා රතුභට කණ්ඩායමේ සෙබළියක වූ ඇය පක්ෂයට එන නවක සහෝදරියන්ට පන්ති පැවැත්වූවාය. ඇයගේ සොහොයුරා ජ.වි.පෙ. ප්‍රබල හිතවතෙකු බව මුළු ගමම දැනසිටි අතර ඇයගේ නිවස ද පක්ෂයේ සාමාජිකයන් නිතර යන එන තැනක් වශයෙන් ආරක්ෂක අංශවල උකුසු ඇසට ලක්ව තිබින. ගමේ සමහරුන් 'ජේ.වී.පී. නංගී' වශයෙන් ඇය හැඳින් වූ කාලයක් විය. ඇය තම ආසනයේ ජේ.වී.පී. සංවිධායකගේම බිරිඳ වීමෙන් පසු මේ ජේ.වී.පී. මුද්‍රාව මැකිය නොහැකි හංවඩුවක් බවට පත්විය.

1989 නොවැම්බර් 14 දින හමුද කණ්ඩායමක් විසින් මා රැගෙන ගිය පසුව ඇය මහා ආත්ම ශක්තියකින් හා නිර්භීතව කටයුතු කර තිබුණත් බාහිර ලෝකයේ සිද්ධ වන කිසිවක්ම නොදැන උන් මම එම මුළු කාලයේම මහා භීතියකින් පෙලෙමින් සිටියේ මගේ බිරිඳ ද අත්අඩංගුවට ගනීදෝ යන වේදනාත්මක සැකයෙනි. කුමක්දෝ වාසනාවකට එසේ නොවුණි.

අවසානයේදී මා රටින් පිටවුයේ මාතර මුලස්ථාන පොලිසියේ සතිපතා පෙනි සිටිය යුතු බවට කොග්ගල පුනරුත්ථාපන කඳවුරෙන් දමන ලද කොන්දේසියකට යටත්ව සිටියදී ය. මා සම්බන්ධයෙන් කඳවුරට වගකියන බවට සහතික වී අත්සන් කර මා භාරගත්තේ මගේ බිරිඳ ය.

මා එක්වරක්වත් පොලිසියේ පෙනී නොසිට අතුරුදහන් වූ විට ආරක්ෂ අංශ සැකකලේ මා පක්ෂයේ භූගත (Under Ground) සාමාජිකයෙකු වූ බවය. ඔවුහු මගේ බිරිඳ සොයා ආහ. ඇය ප්‍රශ්න කිරීම් වලට ලක්විය. මා රටහැර ගියබව ඔවුහු පිළිනොගත්හ. මගේ බිරිඳගේ ආරක්ෂාව



*විජේවීර දරුවන් සහ බිරිඳ සමගින්*

පතා මා 'අයිෆල් කුලුන' අසල ඉන්නා පින්තූරයක් ගෙන ආරක්ෂක අංශ වෙත යැවුවද බිරිඳට සිදුවන බාධා කිරීම්, ප්‍රශ්න කිරීම් නොනැවතින. අවසානයේදී ඇයට සිදුවුයේ මෙතෙක් රැකවරණය ලැබූ මවගේ නිවසින් පිටත් වී දරුවා ද සමඟ අගනුවරට ගොස් මගේ බාප්පාගේ රැකවරණය යටතේ සිටීමට ය.

1991 දී ප්‍රේමදාස ජනාධිපතිවරයා ඝාතනය වුවද 1994 දක්වාම තිබුනේ 17 වසරක් අඛණ්ඩව පැවති යූ.ඇන්.පී. රජයම ය. අද මෙන්ම එකල ද ප්‍රංශයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට ගතු කියන්නන් උන් නිසා මගේ බිරිඳගේ ආරක්ෂාව පතා මා පක්ෂයේ වැඩ නොකළ යුතු බව මගේ අවබෝධය විය.

මා පක්ෂයට ඉදිරිපත් කළ ලියවිල්ල තරමක් දීර්ඝ එකකි. මෙහි සටහන් කරන්නේ එයින් මුලික කරුනු කිහිපයක් පමණි.

පක්ෂය නොපමාව රටේ ජනතාවට ස්වයං විවේච-නයක් කළ යුතු ය. ස්වයං විවේචනයක් කළයුතු වන්නේ කරුනු දෙකක් නිසා ය.

අප දේශප්‍රේමී අරගලයට අවතීර්ණ වී සිටියදී රට ජනතාව වෙනුවෙන් කරන ලද්දා වූ කැපකිරීම් කොතරම් උදා ර වුවද, ගණනය කළ නොහැකි තරම් අති දැවැන්ත වුවද ජනතාවගේ ජීවිතවලට ආදරය කරන පක්ෂයක් වශයෙන් අප අතින් සිදු නොවිය යුතු වැරදි ප්‍රමාණයක් සිදුවිය. මේ වැරදි සදහා අප ජනතාව ගෙන් සමාව ඉල්ලා සිටිය යුතු ය. කාලයට ඉඩ දී වැරදි අමතක වීමට සැලැස්වීමට වඩා, තර්ක කර වැරදි නිවැරදි කිරීමට උත්සාහ කිරීමට වඩා නිහතමානී වී සමාව ඉල්ලා සිටීම ජනතාවගේ අනුකම්පාව හා ආදරය දිනා ගැනීමේ මගක් වෙයි.

දෙවැන්න, රජය හා විරුද්ධවාදීන් විසින් පක්ෂය නොකළ වැරදි රාශියකට චූදිතයා කර ඇති බැවින් ඒවා ගැන පැහැදිලි කිරීමක් කර නිර්දෝෂ වීම ද අත්‍යාවශ්‍ය වෙයි.

***හමුදාවේ හා පොලිසියේ නිලධාරීන් සිය රැකියාවලින් අස්විය යුතුයයි දුන් නියෝගයත්, එම පවුල්වලට තර්ජනය කිරිමට ගත් තිරණයත් අප කරගත් අංක එකේ අනුවණකමක් ය. අරගලයේ පරාජයට බලපෑ තීරණාත්මක සන්ධිස්ථානය වුයේ එයයි***

සමාජවාදී පොදු දේපල ක්‍රමයක් හෝ වේවා, වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ සහිත සමාජ ක්‍රමයක් බිහි-කෙරුමට වේවා 'ආයුධ සන්නද්ධ අරගලය' තවදුරටත් කෙසේවත් වලංගු ක්‍රමයක් නොවේ. මෙතැන් සිට අප සැලකිය යුත්තේ ආයුධ සන්නද්ධ විප්ලවය යල් පැනගිය ක්‍රමයක් ලෙසිනි. පක්ෂය ජීවිත පරිත්‍යාගයෙන් සොයාගත් යම් ආයුධ ප්‍රමාණයක් අප සතුව ඇතිමුත් තවදුරටත් ඒවා ගැන විශ්වාසය නොතැබිය යුතු ය. ඒවා මළකඩ කා දිරාපත්වීමට ඉඩදිය යුතු ය.

මින් පසුව ජනතාව දිනාගැනීමේ අපගේ උපාය මාර්ගය විය යුත්තේ ඡන්ද ක්‍රමයයි. එහිදී ඇතිවන මැතිවරණ ගැටුම් හා කාල කෝලාහල වලදී යම්කිසි පාර්ශ්වයක් අපට පහර දුනහොත් අප ප්‍රතිප්‍රහාර නොදිය යුතුයි. හැකිතරම් ඉවසාගෙන සිටිය යුතුයි. ප්‍රතිප්‍රහාර දීමේ ක්‍රමයකට වඩා මේ ක්‍රමයෙන් ජනතාවගේ අනුකම්පාව දිනාගත හැකිවෙයි.

(1991 දී තරම් ඈත කාලයෙක මවිසින් මෙසේ යෝජනා කරන ලදද, මගේ යෝජනාව පක්ෂයේ අවධානයට ලක්වෙන්නට ඇත්ද නැත්ද පසු කලෙක ඡන්ද සටනේ යෙදුන අපගේ සහෝදරවරුන් දෙඅත බැඳගෙන අහිංසක ලෙස ගුටි කෑ පුවත් ඇසු මගේ ඉවසීමේ සීමාව ද රතු කට්ට පැනගියේ "ගුටිකනවයි කියල මෙහෙත් ගුටි කෑ යුතු දැයි " සිතීමෙනි. දේශපාලන ගැටුම්වලදී ප්‍රතිප්‍රහාර දෙන්නේ නම් අන් කාහටත් වඩා හොඳින් එය කළ හැක්කේ ජ.වි.පෙ ට බව අවිවාදිත ය. ජේ. ආර්. ගේ මැර හමුද සෑම විරුද්ධ දේශපාලන පක්ෂයකටම පහර දීමෙන් ආ කාලයේ කැකිරාව එ.ජා.ප මන්ත්‍රී ජී.ඩී. මහින්දසෙ-ෝමගේ හක්ක කුඩුවෙන්නට උදළු බඳෙන් පහර දුන්නේ පක්ෂයේ සොයුරෙකි. (ඔහු කෘතිම හක්කක් දමා ගැනීමට ඇමරිකාවට ගියබව පැවසෙ.')

දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය විසින් ගම්වල, නගරවල සිටි හොරුන්, මං කොල්ලකරුවන්, හොරසුරා පෙරන්නන් හා බේබද්දන්ට දඬුවම් පැමිණ වීමත්, ඉඩම් නඩු, පවුල් ආරවුල් වැනි දේවල් විසඳන්නට යාමත් ව්‍යාපාරයට කිසිසේත් අදළ නැති අනවශ්‍ය කාරියකට අත දැමීමකි. ධනේෂ්වර ක්‍රමයේ අර්බුදය මෝරා පුපුරා ධනේෂ්වර ගර්භාෂයේ වැඩෙන මෙවැනි ව්‍යාධි ද හේතුවෙයි. ඉදින් ධනේෂ්වර ක්‍රමයක් තුළදීම අප ඒවා සුවකරන්නට යන්නේ කුමකද? දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය මෙම පොලිස් රාජකාරි කිරීමෙ-න් පොලීසිවලට ලැබෙන පැමිණිලි නැත්තටම නැති වී ඔවුන් එම රාජකාරි වලින් නිදහස් වුහ. එයින් පක්ෂයේ ක්‍රියාකාරින් ගැන හොඳින් හොයා බලා අත්අඩංගුවට ගැනීමට හා මර්ධනය කිරිමට එම නිලධාරින්ට හොදට කාල වේලාව ලැබිණ.

හමුදවේ හා පොලිසියේ නිලධාරීන් සිය රැකියාවලින් අස්විය යුතුයයි දුන් නියෝගයත්, එම පවුල්වලට තර්ජනය කිරිමට ගත් තිරණයක් අප කරගත් අංක එකේ අනුවණකමක ය. අරගලයේ පරාජයට බලපෑ තීරණාත්මක සන්ධිස්ථානය වුයේ එයයි.

මේ කරුනු සඳහන් දීර්ඝ ලියවිල්ල මා යොමුකළේ පක්ෂයේ දේශපාලන මණ්ඩලයට. මා එය භාරදුන්නේ සංවිධායක ලෙස සිටි ඩේවිඩ්සන්ට ය. ඔහු එය ලන්ඩන් ශාඛාවට යැවූ බවත්, ලන්ඩන් ශාඛාව එය වැදගත් ලියවිල්ලක් බව පිළිගත් බවත් සෝමවංශ අමරසිංහ සහෝදරයා දැන් යුරෝපයට පැමිණ සිටින නිසා එය ඔහු අතට පත්වන බවත් ඩේවිඩ්සන් මට දැනුම් දුන්නේ ය.

මා පක්ෂයේ නමින් දේශපාලන රැකවරණ ලබාගෙන පක්ෂයේ වැඩනොකර සිටින්නේ යයි එක්තරා සොයුරෙකු මට චෝදනා නගමින් සිටින බව දැන් ගන්නට ලැබිණ. එක්දිනක අප හමුවූ අවස්ථාවක මේ මාතෘකාව මතුවිය. අප අතර ඇති වූ සංවාදයේදී මම ඔහුට මෙසේ පැවසුවෙමි.

"සමහරුන්ට දේශපාලන රැකවරණ ලැබෙනවා කියන්නේ මහා විශාල ජයග්‍රහණයක් බව ඇත්ත. ඒත් ප්‍රංශයට ඇවිල්ලා දේශපාලන රැකවරන ලබාගන්න වුනා කියන එක මගේ ජීවිතේ මම ලබපු විශාලම පරාජයක්. මගේ පවුලේ කෙනෙක් මරුණත් මට මගේ රටට යන්න බෑ. (මා ප්‍රංශයට පැමිණ වසර පහක් ගතවෙද්දී මගේ මව මිය ගියාය. මා වැදු මවගේ මරණයටත් නැති අවාසනාවත්න පුතෙකු විය) කවදවත් ලංකාව දාලා පිටරකට යන්න උවමනාවත් නොතිබුන මට මෙහෙම එන්න උනේ මම කරපු දේශපාලනේ නිසා. ඒ නිසා දේශපාලන රැකවරණ කියලා මට මේ ලැබිලා තියෙන්නේ දඬුවමක් මිසක් තෑග්ගක්වත් වරප්‍රසාදයක්වත් නොවෙයි.

ඊළඟ කාරණය , මම මෙහේදී පක්ෂයේ වැඩ නොකළා වුනත් මගේ ජීවිත කාලෙදී කරපු වැඩ ටික හොදටම ඇති. ඒ කියන්නේ පක්ෂයේ නමින් දේශපාලන රැකවරණ ගත්තත් මට පව් නෑ. මම පක්ෂයට ණයගැති නෑ. දැන් ඔය පක්ෂයට කිසිම සම්බන්දයක් නැති මිනිස්සුයි, උපන් ගෙයි ශ්‍රී ලංකා කාරයොයි, යු.ඇන්.පී. කාරයොයි පක්ෂයේ පරම හතුරෙයි හැමෝම මෙහේදි දේශපාලන රැකවරණ ඉල්ලා තියෙන්නේ පක්ෂයේ නමින් නෙවෙයිද? එතකොට සහෝදරයා හිතනවද ඒ අයත් පක්ෂයේ වැඩකළ යුතුයි කියලා?

ඊළඟ වැදගත් කාරණෝ මම පක්ෂයේ නම ගාවන්නේ නැතිව ලංකාවේ හමුදවෙන් මර්ධනය ලක්වුන නිකම්ම නිකම් පුරුවැසියෙක් විදියට දේශපාලන රැකවරන ඉල්ලුවත් මට ලැබෙන කාරණා ඕනතරම් තිබිණා. 'ජාත්‍යන්තර රතුකුරුස සංවිධානය' බුස්ස රැඳවුම් කඳවුරට ආපු වෙලාවේ මම ලියපදිංචි කළ කාර්ඩ්පත, මම ප්‍රංශෙට ඇවිල්ලා 'ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල්' එකට දීපු තොරතුර වලට පස්සේ එයාලා මට දීපු සහතිකය, ප්‍රංශයේ කොමර්ඩ් ඉස්පිරිතාලෙන් (ප්‍රංශයට පැමිණ දේශපාලන රැකවරණ අයැදුම් කරන සෑම කෙනෙකුන් වෙනුවෙන්ම නොමිලේ සේවාවන් සපයන රෝහල) මගේ ශරීරයේ තිබෙන බාහිර

33 පිටට